# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# Ministry of Public Administration and Management

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
Website : www.pubad.gov.lk

| දුරකතන | ෆැක්ස් | ඊ-මේල් |
|---|---|---|
| தொலைபேசி: (94) 011-2696211-13 | தொலைநகல் (94) 011-2695279 | மின்னஞ்சல் secretary@pubad.gov.lk |
| Telephone | Fax | E-mail |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: 76/1/15/විශේෂ VIII වෙළුම | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி: / Date: 2016.11.18 |

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්.

**ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන්**
**විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.**

මගේ සමාංක හා 2016.10.06 දිනැති ලිපියෙන් අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ ලකුණු පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක: PSC/APP/07/930/2016 හා 2016.11.16 දිනැති ලිපියෙන් සංශෝධනය කර අනුමත කර ඇත. (පිටපතක් අමුණා ඇත)

02. මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය.

<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය</u>

ජ්‍යෙෂ්ඨතාවය (උපරිම ලකුණු 60)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සක්‍රීය අවුරුදු 18 ක සේවා කාලය හා I ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු එළඹෙන සෑම වසරක් සඳහාම එක් වසරකට ලකුණු 10 බැගින් ද , මාස 06 කට නොඅඩු කාලයකට ලකුණු 05 බැගින්ද , මාස 03 කට නොඅඩු කාලයකට ලකුණු 2.5 බැගින්ද ලකුණු ලබා දෙනු ලැබේ.

කුසලතාවය (උපරිම ලකුණු 40)

I. නව්‍යතාවයන් හා නවෝත්පාදනයන් (Innovativeness and Creativity)

ආයතනයේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා අයදුම්කරු විසින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලද, එක් කාර්යයක් සඳහා ලකුණු 2.5 බැගින් කාර්යයන් 04 ක් සඳහා උපරිම ලකුණු 10 ක් ලබා දෙනු ලැබේ. ලකුණු 10

සටහන - (අ) අයදුම්කරුවන්ගේ පසුගිය වසර 05 ක කාර්ය සාධන වාර්තා පදනම් කර ගෙන උක්ත කාර්යයන් හඳුනාගනු ලබයි.

(ආ) අයදුම්කරුවන් විසින් එම කාර්යයන් සාර්ථකව නිම කරන ලද බවට තහවුරු කෙරෙන ප්‍රදානයන්, ප්‍රශංසා හෝ සහතිකපත්‍ර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළහොත් උක්ත කාර්යයන් සනාථ කිරීමට ඒවාද ඉවහල් කරගනු ලැබේ.

II. ඉදිරිපත් කිරීම (Power Point Presentation) ලකුණු 25

උක්ත I හි සඳහන් කාර්යයක් සම්බන්ධයෙන් පරිගණකය ආශ්‍රයෙන් (Power Point) සිදු කරනු ලබනු විනාඩි 10 ක ඉදිරිපත් කිරීම.

i. අරමුණු හා දැක්ම (Objectives and Vision) ලකුණු 05

ii. අදාළත්වය (Relevancy) ලකුණු 05

iii. නිර්මාණශීලී බව (Creativity) ලකුණු 05

iv. කාල කළමනාකරණය (Time Management) ලකුණු 05

v. වෙනත් භාෂා ප්‍රවීණතාවය (Proficiency in any other Language) ලකුණු 05

සටහන: - අ) ඉහත (V) නිර්ණායකය යටතේ ලකුණු ලබා ගත හැක්කේ අයදුම්කරු ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගනු ලැබූ භාෂාවට අන්‍ය වූ රාජ්‍ය භාෂාව / සන්ධාන භාෂාව මඟින් මෙම ඉදිරිපත් කිරීම සිදු කරනු ලබන්නේ නම් පමණි.

ආ) මෙම ඉදිරිපත් කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් විනාඩි 05 ක කාලයක් අයදුම්කරුගෙන් ප්‍රශ්න අසනු ලැබේ.

ඇ) ඉදිරිපත් කිරීමට අදාළ දෘඩ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලට එම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඩ පිටපතක්ද මෙම අවස්ථාවේදී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

III. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය ලකුණු 05

ඉහත ඉදිරිපත් කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරිපත් කරනු ලබන ගැටළුවලට අදාළව පහත කරුණු යටතේ අයදුම්කරුවන්ට උපරිම ලකුණු 05 ක් ප්‍රදානය කරනු ලැබේ.

i. නායකත්වය (Leadership) ලකුණු 01

ii. සන්නිවේදන කුසලතාවයන් (Communication Skills) ලකුණු 01

iii. ආත්ම විශ්වාසය (Confidence) ලකුණු 01

iv. තීරණ ගැනීමේ හැකියාව සහ විචක්ෂණශීලි බව (Analytical Thinking) ලකුණු 01

v. වෘත්තීය ආචාරශීලීභාවය (Professional Courtesy) ලකුණු 01